# රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල
# 4 ශ්‍රේණිය - 2020
# ගණිතය
## පළමු වාරය පැවරුම් අංක 03

- දෙමව්පියන් සඳහා උපදෙස්,
  - මෙම අභ්‍යාස පොතක කරවන්න. හැකි නම් මුද්‍රණය කර දරුවාට ලබා දෙන්න.
  - පිළිතුරු පමණක් දරුවාට ලිවීමට සලස්වන්න. ප්‍රශ්න දෙමව්පියන් විසින් ලියා දෙන්න.
  - හැකිනම් පිළිතුරු හා අකුරු නිවැරදි කරන්න.
  - මෙම අභ්‍යාස වයිබර් කණ්ඩායම් මගින් හුවමාරු කර ගන්න.
  - පාසල ආරම්භ වන දිනක මෙම පොත රැගෙන එන්න.
  - අවශ්‍ය අවස්ථාවල දී ළමයින්ගේ වැඩවලට දෙමව්පියන් සහය වන්න.

## පාඩම් අංක 11 බෙදීම

- මෙම පාඩම සඳහා දෙමව්පියන් දරුවන්ට සහය ලබා දෙන්න.
- ඇට වර්ග හෝ ගල් කැට යොදා ගෙන ගොඩවල්වලට වෙන් කරන ආකාරය පැහැදිලි කර දෙන්න.

1. 8හි දෙකේ ගොඩවල් කීය ද? ........4.........



ඉහත ආකාරයට දරුවා සමග විවිධ ද්‍රව්‍ය යොදා ගෙන පහත ගැටළුවලට පිළිතුරු ලබා ගන්න.

2. 12හි දෙකේ ගොඩවල් කීය ද? ...................
3. 18හි දෙකේ ගොඩවල් කීය ද? ...................
4. 14හි දෙකේ ගොඩවල් කීය ද? ...................
5. 16හි දෙකේ ගොඩවල් කීය ද? ...................
6. දෙදෙනෙකු අතර අඹ ගෙඩි 24ක් සම සම ව බෙදා දෙන ලද්දේ නම් එක් අයෙකුට ලැබුණු අඹ ගෙඩි ගණන කීය ද?




දහයේ ගොඩවල් දෙක දෙකට බෙදූ විට එකකි.
එකේ ගොඩවල් හතර දෙකට බෙදූ විට දෙකකි.

$24 \div 2 = 12$

- ඉහත ගණන දීර්ඝ ක්‍රමයට පහත ආකාරයට බෙදමු.

```
      12
   ┌─────
 2 │ 24
   │ 2↓
   │ ───
   │ 04
   │  4
   │ ───
   │  0
```

24 ÷ 2 = 12යි.

- දෙකට දෙකේ ඒවා එකකි. එය දහයේ පේළියේ ඉහළින් ලියන්න.
- දෙවාරයක් එක දෙකකි. එය දෙකට පහළින් ලියන්න.
- දෙකෙන් දෙකක් අඩු කළ විට බින්දුවකි. එය දෙකට පහළින් ලියන්න.
- එකේ ඒවා හතර පහළට ගෙනැවිත් බින්දුව ළඟින් ලියන්න.
- හතරට දෙකේ ඒවා දෙකකි. එය එකේ පේළියේ ඉහළින් ලියන්න.
- දෙවාරයක් දෙක හතරකි. එය හතරට පහළින් ලියන්න.
- හතරෙන් හතරක් අඩු කළ විට බින්දුවකි.

- ඉහත ක්‍රමයට පහත ගණන් බෙදා පිළිතුරු ලබා ගන්න.

(1) 2 | 68

(2) 2 | 84

(3) 2 | 46

(4) 2 | 80

(5) 2 | 42

1. 9හි දෙකේ ගොඩවල් කීය ද? ....4.... ඉතුරු 1



ඉහත ආකාරයට දරුවා සමග විවිධ ද්‍රව්‍ය යොදා ගෙන පහත ගැටළුවලට පිළිතුරු ලබා ගන්න.

2. 13හි දෙකේ ගොඩවල් කීය ද? ................ඉතුරු.........
3. 19හි දෙකේ ගොඩවල් කීය ද? ................ඉතුරු.........
4. 15හි දෙකේ ගොඩවල් කීය ද? ................ඉතුරු.........
5. 17හි දෙකේ ගොඩවල් කීය ද? ................ඉතුරු.........

6. දෙදෙනෙකු අතර අඹ ගෙඩි 67ක් සම සම ව බෙදා දෙන ලද්දේ නම් එක් අයෙකුට ලැබුණු අඹ ගෙඩි ගණන කීය ද?

- ඉහත ගණන දීර්ඝ ක්‍රමයට පහත ආකාරයට බෙදමු.

```
     33
2 | 67
    6↓
    07
    06
     1
```

හයට දෙකේ ඒවා තුනකි. එය දහයේ පේළියේ ඉහළින් ලියන්න.

දෙවාරයක් තුන හයකි. එය හයට පහළින් ලියන්න.

හයෙන් හයක් අඩු කළ විට බින්දුවකි. එය දහයේ පේළියේ පහළින් ලියන්න.

එකේ ඒවා හත පහළට ගේන්න. එවිට ඔක්කොම 7කි.

හතට දෙකේ ඒවා තුනකි. එය එකේ පේළියේ ඉහළින් ලියන්න.

දෙවාරයක් තුන හයකි. එය එකේ පේළියේ පහළින් ලියන්න.

හතෙන් හයක් අඩු කළ විට එකකි. එය පහළින් ලියන්න.

67 ÷ 2 = 33ඉතුරු 1

- ඉහත ක්‍රමයට පහත ගණන් බෙදා පිළිතුරු ලබා ගන්න.

① 2 | 65

② 2 | 83

③ 2 | 87

④ 2 | 74

⑤ 2 | 49

- ගණිතය පෙළ පොතේ ඇති 33 පිටුවේ ඇති අභ්‍යාස කරන්න.

01.ලොවි ගෙඩි 74ක් දෙදෙනෙකු අතර සමසේ බෙදූ විට එක් අයෙකුට ලැබෙන ගෙඩි ගණන කීය ද?

```
     37
2 | 74
    6↓
    14
    14
     0
```

හතට දෙකේ ඒවා තුනකි. එය දහයේ පේළියේ ඉහළින් ලියන්න.

දෙවාරයක් තුන හයකි. එය හතට පහළින් ලියන්න

හතෙන් හයක් අඩු කළ විට එකකි. එය හයට පහළින් ලියන්න. එය දහයේ ගොඩකි.

එකේ ඒවා හතර පහළට ගේන්න. එය දහයේ 1 ළඟින් ලියන්න. දැන් ඔක්කොම දහ හතරකි.

දහ හතරට දෙකේ ඒවා හතකි. එය එකේ පේළියේ ඉහළින් ලියන්න.

දෙවාරයක් හත දහ හතරකි. එය දහ හතරට පහළින් ලියන්න.

දහ හතරෙන් දහ හතරක් අඩු කළ විට බින්දුවකි.

74 ÷ 2 = 37යි.

02. 649 දෙකෙන් බෙදමු.

```
    324
  ┌────
2 │ 649
    6↓
   ───
    04
    04↓
   ───
     09
     08
   ───
     01
```

හයට දෙකේ ඒවා තුනකි. එය සියයේ පේළියේ ඉහළින් ලියන්න.

දෙවාරයක් තුන හයකි. එය හයට පහළින් ලියන්න

හයෙන් හයක් අඩු කළ විට බින්දුවකි. එය හයටපහළින් ලියන්න.

දහයේ ඒවා හතර පහළට ගේන්න. හතරට දෙකේ ගොඩවල් බලන්න.

හතරට දෙකේ ඒවා දෙකකි. එය දහයේ පේළියේ ඉහළින් ලියන්න.

දෙවාරයක් දෙක හතරකි. එය හතරට පහළින් ලියන්න.

හතරෙන් හතරක් අඩු කළ විට බින්දුවකි. එය හතරට පහළින් ලියන්න.

එකේ නවය පහළට ගේන්න. දැන් නවයට දෙකේ ගොඩවල් බලන්න.

නවයට දෙකේ ගොඩවල් හතරකි. එය එකේ පේළියේ නවයට ඉහළින් ලියන්න.

දෙවාරයක් හතර අටකි. එය නවයට පහළින් ලියන්න. නවයෙන් අටක් අඩු කරන්න. එවිට එකකි. එට අටට පහළින් ලියන්න.

649 ÷ 2 = 324ඉතුරු 1

- ඉහත ක්‍රමයට පහත ගණන් බෙදා පිළිතුරු ලබා ගන්න.

(1) 2 | 58

(2) 2 | 76

(3) 2 | 90

(4) 2 | 70

(5) 2 | 38

- ගණිතය පෙළ පොතේ ඇති 34 සහ 35 පිටුවේ ඇති අභ්‍යාස කරන්න.
- ගණිතය පෙළපොතේ පුනරීක්ෂණ අභ්‍යාස පිටු අංක 43 කරන්න.

- දීර්ඝ ක්‍රමයට බෙදන්න.

(1) 486 ÷ 2 (02) 847÷ 2 (03) 806÷ 2 (04) 728 ÷ 2 (5) 476 ÷ 2